**මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------------------------------

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2012 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී - 105 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4(6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------------

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා නියාමන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ නැගෙනහිර, වයඹ, මධ්‍යම හා සබරගමුව පළාත් සභා, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සෞඛ්‍ය, සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීම හා ද්විතියික මට්ටමේ රෝහල්වල හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පහසුකම් හා උපකරණ වැඩිදියුණු කිරීම මඟින් අත්‍යවශ්‍ය ඖෂධවල නිෂ්පාදන ධාරිතාවය ශක්තිමත් කිරීම හා එමඟින් බෝ නොවන රෝග කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබා දීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,332 කට සමාන ජපන් යෙන් මිලියන 4,760 ක් වන අතර, රු.මිලියන 5,155 කට සමාන ජපන් යෙන් මිලියන 3,935 ක් සැපයීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජුලි 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජුලි 23 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා

ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2014 හා 2015 වර්ෂවලදී සිදුකර තිබුණු ඍජු ගෙවීම් පිළිවෙලින් රු.776,071 ක් හා රු.මිලියන 232.37 ක් ගිණුම් ගත කර නොතිබුණි. එබැවින් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය සහ සිවිල් වැඩ ශේෂයන් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූලායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 3,935 | 5,155 | 1,530 | 628 | 692 | 1,663 | 2,018 |
| ශ්‍රී ලං ර | 825 | 1,177 | 310 | 108 | 132 | 253 | 370 |
| එකතුව | 4,760 | 6,332 | 1,840 | 736 | 824 | 1,916 | 2,388 |

ඉහත තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ රු.මිලියන 1,530 ක වෙන්කිරීම් සිදු කර තිබුණු අතර, ඉන් රු.මිලියන 692 ක මුදලක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ කාර්යයන් සිදුකිරීම සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම උපයෝජනය කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, වරකාපොල, ගල්ගමුව, තෙල්දෙණිය හා කලවන්චිකුඩි මූලික රෝහල්වල ධාරිතාවයන් වැඩිදියුණු කිරීමට හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවයන් වැඩිදියුණු කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා භෞතික ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, රු.මිලියන 514 ක පිරිවැයකට වරකාපොල මූලික රෝහල සඳහා මහල් 06 ක සායන ගොඩනැගිල්ල හා මහල් 02 ක නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීමේ වැඩ 2015 ජුනි 20 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද ගොඩනැගිලි ඉදිකිරීම් වැඩවල භෞතික ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 දිනට සියයට 86 ක් විය. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කරන ලද පැහැදිලි කිරීමට අනුව, අයහපත් කාලගුණික තත්ත්වය, පොළවේ අනපේක්ෂිත තත්ත්වයන් හා කොන්ත්‍රාත්කරුගේ අසමත්වීම් හේතුවෙන් ඉදිකිරීම් වැඩ නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද 2014 දෙසැම්බර් දක්වා සැපයීමට එකඟ වී තිබූ උපදේශක සේවා සඳහා වූ කාල පරිච්ඡේදය, ඉදිකිරීම් වැඩවල ප්‍රමාදයන් හේතුවෙන් 2016 පෙබරවාරි දක්වා දීර්ඝ කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 6.13 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(ආ) පැකේජ - 1 යටතේ ගල්ගමුව මූලික රෝහලේ ශල්‍යාගාර හා වාට්ටු සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ නිම කර 2015 මැයි 30 දින භාර දී තිබුණි. කෙසේ වුවද අදාල ශල්‍යාගාර හා වාට්ටු සාමාන්‍ය ජනතාවගේ භාවිතය සඳහා 2016 පෙබරවාරි 29 වන විටත් විවෘත කර නොතිබුණි. තවද පැකේජ - II යටතේ රු.මිලියන 239 පිරිවැයකට 2014 ඔක්තෝබර් 05 දින පිරිනමන ලද බාහිර රෝගී අංශය හා පරිපාලන ඒකකය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ වායු සමීකරණ පද්ධතිය සවිකිරීම සඳහා අවස්ථා 02 කදී කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණද, නිම කර නොතිබුණි.

(ඇ) 2015 අගෝස්තු 06 සිට අවස්ථා 02 කදී කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණද, තෙල්දෙණිය මූලික රෝහල සඳහා මහල් 05 ක නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 374 ක පිරිවැයකට පිරිනමන ලද කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 31 දිනට නිම කර නොතිබුණි.

(ඈ) කල්වන්චිකුඩි මූලික රෝහලේ බාහිර රෝගී අංශය සඳහා ගොඩනැගිල්ල දීර්ඝ කිරීම, වෙනත් ගොඩනැගිලි අලුත්වැඩියා වැඩ පැකේජ 03 ක් යටතේ සිදුකර තිබූ අතර 2015 ජූනි 30 දිනට බොහෝදුරට නිමකර තිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, රෝහල් 04 ක් සඳහා ජීව වෛද්‍ය උපකරණ අත්කර ගැනීම සඳහා රු.මිලියන 768.36 ක මුදලක් වෙන්කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කළ යුතුව තිබුණි. කෙසේ වුවද තෙල්දෙණිය සහ කලවන්චිකුඩි මූලික රෝහල් සඳහා ජීව වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා 2016 පෙබරවාරි 10 දින පළාත් සෞඛ්‍ය බලධාරීන් ගිවිසුම්වලට පමණක් එළඹ තිබුණි. වරකාපොල හා ගල්ගමුව මූලික රෝහල් සඳහා ජීව වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීමට පළාත් සෞඛ්‍ය බලධාරීන් විසින් ගිවිසුම්වලට එළඹීමට 2015 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, රු.මිලියන 1,493 ක ඇස්තමේන්තුගත පිරිවැයකට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම පිළිබඳ සංවර්ධන වැඩවලින් සියයට 50 ක් 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද අදාළ වැඩ ආරම්භක අදියරයන්හි පැවති බව ප්‍රගති වාර්තාවලින් දැක්වුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

වරකාපොල මූලික රෝහලේ ඉදිකිරීම් වැඩ පිළිබඳ මුල් ප්‍රමාණ පත්‍ර, ණය ගිවිසුම යටතේ කරන ලද වෙන් කිරීම් පදනම් කරගෙන පිළියෙල කර තිබූ බවත් ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ අත්‍යවශ්‍ය අවශ්‍යතා කිහිපයක් නොසලකා ඇති බවත් නිරීක්ෂණය විය. එබැවින්, ගිනි ආරක්ෂණ පද්ධතිය, වෛද්‍ය ගෑස් පද්ධතිය (Medical Gas System) සවිකිරීම, ඉහළ මහල් 02 ක ටයිල් වැඩ, නේවාසික ගොඩනැගිල්ලේ සිවිලිමේ වැඩ හා පඩිපෙලේ රේලින් වැඩ ආදී කාර්යයන් මුල් ප්‍රමාණ පත්‍රවලට ඇතුළත් කර නොතිබූ බැවින් ශ්‍රී ලංකා රජය විසින් කරන ලද වෙන් කිරීම උපයෝජනය කිරීම මඟින් එම වැඩ නිම කිරීම සඳහා රු.මිලියන 55.44 ක පිරිවැයකට වෙනම කොන්ත්‍රාත්තු වෙනත් කොන්ත්‍රාත්තුකරුවන්ට පිරිනමා තිබුණි. ඊට අමතරව, රෝහල සඳහා ප්‍රවේශ මාර්ගවල පුනරුත්ථාපන වැඩ රු.මිලියන 30.15 ක පිරිවැයකට වෙනත් කොන්ත්‍රාත්තුකරුවන් මඟින් නිම කර තිබුණි. තවද, වායුසමීකරණ පද්ධතිය, විදුලි සෝපාන සවිකිරීම, මලාපවහන පවිත්‍ර කිරීම් පිරියත සඳහා මුල් ප්‍රමාණ පත්‍රවල කරන ලද එකතුව රු.මිලියන 85.54 ක තාවකාලික වෙන්කිරීම් මත ඒවා වෙනත් කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදු කර තිබූ අතර රු.මිලියන 23.44 ක අතිරේක පිරිවැයක් ඒ සඳහා දරා තිබුණි.